## General Information Technology

## Provincial Department of Education – Sabaragamuwa

# 7.3 වෙබ් අඩවි සංවර්ධනය – පැවරුම Home Assignment-1

**HTML ලේඛනයක් සකස් කිරීම**

**වීඩියෝ පාඩම පරිශීලනය කිරීමෙන් පසු මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.**

1. Windows හි Notepad භාවිතා කර පහත HTML කේත එහි යතුරු ලියනය කරන්න.
   එක් එක් පේලිය අවසන Enter key තද කරන්න.

```
<html>

<head>

<title>

Preparing a Document for the World Wide Web

</title>

</head>

<body>

<h1>Preparing a Document for the World Wide Web</h1>

</body></html>
```

2. ඔබ යතුරු ලියනය කල ගොනුව(File එක) පාඨ ගොනුවක් (Text File) ලෙස ඔබ කලින් සකසා ගත් ෆෝල්ඩරය තුල සුරකින්න. ගොනු නාමය ලෙස index.html යන්න ලබා දෙන්න.
3. ඔබේ වෙබ් බ්‍රවුසරය මගින් එම ගොනුව විවෘත කරන්න. එවිට ඔබ ඉහත යතුරු ලියන කල ගොනුව වෙබ් පිටුවක් ලෙස විද්‍යාමාන වනු ඇත. (ගොනුව මත right clicl කර open with මගින් වෙබ් බ්‍රව්සරයක නමක් ලබා දෙන්න.)
4. තව දුරටත් වෙබ් පිටුවේ වෙනස් කම්, එකතු කිරීම් සිදු කිරීමේ දී පළමුව පාඨගොනුව notepad මගින් විවෘත කර එහි යතුරු ලියනය කර save කිරීම මගින් එම ගොනුව නැවත යාවත් කාලීන කරන්න.
5. දැන් වෙබ් පිටුව විවෘතව තිබේ නම් F5 යතුර ඔබා වෙබ් බිටුව reload කරන්න. (From the appropriate menu or toolbar in your browser, select “Reload current page” to view the changes. )
6. ඔබ වැඩ කරන විට notepad හෝ බ්‍රවුසරය වසා දැමීම අවශ්‍ය නොවේ.
   සෑම HTML ගොනු නාමයකටම කොටස් දෙකක් ඇත මෙය තිත(.) කින් වෙන් කර ඇත. පළමු කොටස නම වන අතර (ඔබට ගොනුව ලබා දීමට අවශ්‍ය ඕනෑම නමක්) දෙවන කොටස "html" විය යුතුය.
   වෙබ් අඩවි වල "මුල් පිටුව" index.html ලෙස නම් කළ යුතුය.